**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව**

# Master of Arts Degree in Sociology

# ශිෂ්‍ය අත් පොත

# Student Hand Book

පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

රුහුණ විශ්වවිද්‍යාලය

මාතර

Faculty of Graduate Studies

University of Ruhuna

Matara

මෙම අත්පොතෙහි සඳහන් වනුයේ අදාල අතුරු ව්‍යවස්ථාවන් මගින් උපුටා ගෙන උපාධි අපේක්ෂකයින්ගේ පහසුව සහ දැනගැනීම සඳහා අවශ්‍ය විය හැකි තොරතුරු කිහිපයක් පමණි. වැඩිදුර තොරතුරු සහ පැහැදිලි කිරීම් සඳහා අදාල අතුරු ව්‍යවස්ථාවන් හා නීති පරිශීලනය කරන්න. තවදුරටත් මෙම අත්පොතෙහි සඳහන් කරුණු පූර්ව දැනුම් දීමකින් තොරව සංශෝධනය කිරීමේ සහ වෙනස් කිරීමේ අයිතිය රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව සතු වේ.

**රුහුණ විශ්විද්‍යාලයේ දැක්ම හා මෙහෙවර**

**රුහුණ විශ්වවිද්‍යාලයේ දැක්ම**

***Vision of the University of Ruhuna***

දැයේ ප්‍රමුඛතම බුද්ධිමය කේන්ස්ථානය බවට පත්වීම

To be the prime intellectual thrust of the nation

**රුහුණ විශ්වවිද්‍යාලයේ මෙහෙවර**

***Mission of the University of Ruhuna***

ඉගැන්වීම්, පර්යේෂණ සහ සේවා මගින් සමාජයට සේවය කිරීම පිණිස දැනුම හා කුසලතා වර්ධනය කිරීම

To advance knowledge and skills through teaching, research and services to serve the society

## හැඳින්වීම

## රුහුණ විශ්වවිද්‍යාලය

1972 අංක 1 දරණ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ පිහිටුවා තිබුණු ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ මණ්ඩපයක් වශයෙන් 1978 අගෝස්තු මස 28 වැනි දින මාතර මණ්ඩපය ආරම්භ කරන ලදී. 1979 දී, 1978 අංක 16 දරණ විශ්විද්‍යාල පනත ක්‍රියාත්මක වීමෙන් පසු එකී විධිවිධාන යටතේ මෙතෙක් එක් විශ්වවිද්‍යාලයක් යටතේ පැවති මණ්ඩප සියල්ලම ස්වාධීන විශ්විද්‍යාල බවට පත් විය. ඒ අනුව මාතර මණ්ඩපය 1979 ජනවාරි මස 01 වැනි දින සිට "රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය" නමින් විද්‍යායතනයක් වශයෙන් ස්ථාපිත විය. ආරම්භයේදී මෙම විශ්වවිද්‍යාල විද්‍යායතනය, කලා පීඨය, වෛද්‍ය පීඨය, කෘෂිකර්ම පීඨය සහ විද්‍යා පීඨය වශයෙන් පීඨ 04 කින් ආරම්භ වූ අතර කලා පීඨය හා විද්‍යා පීඨය මාතර වැල්ලමඩමේත්, කෘෂිකර්ම පීඨය කඹුරුපිටිය මාපලානෙත්, වෛද්‍ය පීඨය ගාල්ල කරාපිටියේත් පිහිටුවන ලදී. 1979 සිට විද්‍යායතනය වශයෙන් පවත්වාගෙන යනු ලැබූ රුහුණ විශ්වවිද්‍යාල විද්‍යායතනය 1984 පෙබරවාරි මස 01 වැනි දින සිට "රුහුණ විශ්වවිද්‍යාලය" නමින් අංග සම්පූර්ණ විශ්වවිද්‍යාලයක් බවට පත් විය.

රුහුණ විශ්වවිද්‍යාලයේ පරිපාලන මූලස්ථානය මාතර වැල්ලමඩමෙහි පිහිටුවන ලද අතර එහි අක්කර 70 කට වඩා විශාල වූ බිම් ප්‍රමාණයක ප්‍රධාන පරිපාලන සංකීර්ණයත්, විද්‍යා, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයත් ස්ථාපනය විය. රුහුණ විශ්වවිද්‍යාලයේ ගොඩනැගිලි සංකීර්ණයේ ගෘහ නිර්මාණ කටයුතු කරන ලද්දේ ලෝක ප්‍රසිද්ධ ගෘහ නිර්මාණ ශිල්පියකු වන ජෙෆරි බාවා මහතා විසිනි. ගොඩනැගිලි ඉදිකිරීම් හා පොදු පහසුකම් සපුරා ලීම නෙදර්ලන්තයේ බැලස්ට් නීඩම් සමාගම විසින් ඉටු කරන ලදී. රුපියල් මිලියන 900ක පමණ වියදමින් ගොඩනගන ලද මෙකී ගොඩනැගිලි සංකීර්ණය සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ශ්‍රී ලංකා රජය මගින් පමණක් ලබාදීම ද සුවිශේෂ විය.

රුහුණ විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය 2000 වසරේදී ගාල්ල හපුගල ප්‍රදේශයේ ආරම්භ කළ අතර 2003 වසරේදී මූල්‍ය හා කළමණාකරණ පීඨයද, 2006 වසරේදී ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයද මාතර වැල්ලමඩම පරිශ්‍රය තුලම ආරම්භ කර ඇත. 2011 වසරේ නොවැම්බර් මාසයේදී පශ්චාද් උපාධි පීඨය හා 2016 වසරේ තාක්ෂණික විද්‍යා පීඨයත්, 2017 වසරේදී සම සෞඛ්‍ය විද්‍යා පීඨයත් ආරම්භ කිරීමත් සමග රුහුණ විශ්වවිද්‍යාලයේ පීඨ සංඛ්‍යාව 10 දක්වා වැඩි විය. දැනට රුහුණ විශ්වවිද්‍යාලයේ සිසුහු 8000 ක පමණ පිරිසක් ප්‍රථම සහ පශ්චාද් උපාධි සඳහා අධ්‍යයන කටයුතුවල නියැලී සිටිති.

# රුහුණ විශ්වවිද්‍යාලයීය ගීතය

බබලන සිරි ලක දකුණේ
විරුවන් බිහි කළ දෙරණේ
පඬුවන් වොරඳුණු පොරණේ
සරසවියයි මේ රුහුණේ

විද්‍යා ශිල්ප කලා නැණ හරවත්
ලබමින් දන මන කරමින් පැණවත්
දෙස බස රැස සුරකින ඔද තෙදවත්
මිනිසුන් වෙමු ලෝ පසසන ගුණවත්

යුක්තිය ශක්තිය බව නිති සිහි කර
දෑ ගොත් කුල මල පටු මත බිඳ හැර
නම රැක පරසිඳු රෝහණ පුරවර
හිරු සඳු වෙමු ලක් සරසවි නිල බර

ගී පද මාලා ඃ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න
තනු නිර්මාණය සහ සංගීතය ඃ ආචාර්ය පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේව

## සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව හැඳින්වීම

රුහුණ විශ්වවිද්‍යාලයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙන් අනුමත වී ඇති සමාජවිද්‍යාව පිළිබඳ එක් අවුරුදු ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා පශ්චාද් උපාධි අපේක්ෂකයන් ලියාපදිංචි කිරීම හා පරීක්ෂණ පැවැත්වීම හා උපාධි ප්‍රධානය 2013 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.

2011 වර්ෂයේ පශ්චාද් උපාධි පීඨය පිහිටුවීමත් සමග උක්ත පාඨමාලාව සඳහා පශ්චාද් උපාධි අපේක්ෂකයින් ලියාපදිංචි කිරීමේ සිට අදාළ උපාධිය පිරිනැමීම දක්වා වූ සියළු කටයුතු අදාළ රෙගුලාසි වලට අනුකූලව සිදු කිරීම රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි පීඨයේ අධීක්ෂණය යටතේ සමාජ විද්‍යා අධ්‍යයනාංශය මගින් සිදු කරනු ලැබේ.

### උපාධි පාඨමාලාවේ නාමය

සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (එක් අවුරුදු)

Master of Arts Degree in Sociology (One Year)

### තාර්කික බව සහ යුක්තිසාධනය (Rationale and Justification)

කිසියම් රටක ප්‍රශස්ත මට්ටමේ සංවර්ධන ක්‍රියාවලියක් ගොඩනංවා පවත්වාගැනීම සඳහා සමාජවිද්‍යාත්මක ඥානයේ වැදගත්කම පිළිගෙන තිබේ. එබැවින් සංවර්ධන ක්‍රියාවලියෙහි තීරණ ගැනීම, සැලසුම් සම්පාදනය, සැලසුම් ක්‍රියාත්මක කිරීම යනාදී සෑම ක්ෂෙත්‍රයකම නිළධාරීන් සතුව සමාජවිද්‍යා න්‍යායන් (Theories), එළඹුම් (Approaches) හා ආකෘති (Models) පිළිබඳ දැනුමක් හා පුහුණුවක් ලබා තිබීමේ අවශ්‍යතාව ඉස්මතු කරනු ලැබේ. එම අවශ්‍යතාව හුදු පර්යේෂණ මත පදනම් වූ පශ්චාද් උපාධි පාඨමාලාවලින් පමණක් සම්පූර්ණ කළ නොහැකි ය. එබැවින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල කිහිපයක් ම දේශන මත පදනම් වූ මෙවැනි පශ්චාද් උපාධි පාඨමාලා ආරම්භ කර ඇතත්, විද්‍යාර්ථීන්ගේ එවැනි පාඨමාලා හැදෑරීමට ලැබෙන පුළුල් ඉල්ලුම සපුරාලීමට ඒකී පාඨමාලාවන් ප්‍රමාණවත් වී නැත. අනෙක් අතට එම පාඨමාලාවන් දකුණු පළාතෙන් බැහැර විශ්වවිද්‍යාල විසින් පවත්වාගෙන යාම තුළ මෙම පළාතෙහි විද්‍යාර්ථීන්ට ඒ සඳහා සහභාගීවීමේ ප්‍රායෝගික දුෂ්කරතා පවතින බව ද පෙනී ගොස් තිබේ. මෙකී අවශ්‍යතා තේරුම් ගනු ලැබූ රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශය මෙම ශාස්ත්‍රපති පාඨමාලාව හඳුන්වාදීම කරනු ලැබේ. එය ජාතික හා කාලීන අවශ්‍යතාවක් ඉටු කිරීමක් ලෙස සැළකිය හැකි ය.

## පාඨමාලාවේ අරමුණු (Objectives of the Course)

ශ්‍රී ලංකාව කේන්ද්‍ර කර ගනිමින් සමස්ත දකුණු ආසියානු සමාජය පිළිබඳ විශේෂිත අවධානයක් සහිතව පුළුල් අරමුණු හතරක් යටතේ මෙම පාඨමාලාව සැළසුම් කර තිබේ.

i. සමාජ විද්‍යාවේ න්‍යායාත්මක හා ක්‍රමවේදාත්මක එළඹුම් පිළිබඳ ගැඹුරු දැනුමක් ලබා දීම
ii. සමකාලීන සමාජ ව්‍යුහය සහ එහි වෙනස්වීම පිළිබඳ සමාජවිද්‍යාත්මක ඥාණය පුළුල් කිරීම
iii. නූතන සමාජීය පරිසරය හා සමාජ ගැටලු පිළිබඳ ශිෂ්‍යයන්ගේ සමාජවිද්‍යාත්මක පරිකල්පනය දියුණු කිරීම
iv. විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ හැකියාවන් වැඩි දියුණු කිරීම

## ඉලක්ක කණ්ඩායම් (Targeted Groups)

i. විශ්වවිද්‍යාල ඇතුලු උසස් අධ්‍යාපන ආයතනවල සමාජවිද්‍යා විෂයය ඉගැන්වීමෙහි නිරත දේශවරුකවරුන්
ii. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන්
iii. සංවර්ධන ක්ෂේත්‍රයන් හි සේවා නියුක්ත රාජ්‍ය, රාජ්‍ය නොවන හා පුද්ගලික අංශයේ නිළධාරීන්
iv. ප්‍රථම උපාධිය හැදෑරීමෙන් පසු වෘත්තීන්වලට ප්‍රවේශ වීම සඳහා සිය විෂය දැනුම තවදුරටත් සංවර්ධනය කර ගැනීමට අපේක්ෂා කරන සමාජවිද්‍යා විද්‍යාර්ථීන්
v. පශ්චාද් උපාධි මට්ටමේ සමාජවිද්‍යා දැනුමක් අපේක්ෂා කරන වෙනත් උපාධිධාරීන්

## පාඨමාලාවේ සංවිධානය (Organization of the Course)

මෙය දේශන මත පදනම් වූ එක් අවුරුදු පාඨමාලාවකි. මෙහි දේශන සිංහල මාධ්‍යයෙන් පැවැත්වේ. මෙම පාඨමාලාවේ සියලු දේශන පාඨමාලා ඒකක ක්‍රමයට අනුකූලව පවත්වනු ලැබේ. ඒ අනුව සතියකට පැය 04 බැගින් සති 15 කින් පාඨමාලා ඒකකයක දේශන සම්පූර්ණ කරනු ලැබේ. මෙම උපාධි පාඨමාලාවේ දේශන සමාසික දෙකකදී සිදු කරනු ලබන අතර වර්ෂයක කාලයකදී විද්‍යාර්ථීන් විසින් පාඨමාලාව නිමකල යුතු වේ. එක් සමාසිකයක් තුල පාඨමාලා ඒකක හතර (04) බැගින් ඒකක අටක් (08) සමාසික දෙකේදී සම්පූර්ණ කල යුතුය. පාඨමාලා ඒකකයක් සඳහා දේශන පැය ගණන හැටකි. (60) සෑම සාමාසිකයක් අවසානයේදීම එක් එක් ප්‍රශ්න පත්‍රය වෙනුවෙන් ලිඛිත විභාගයකට පෙනී සිටිය යුතු වේ. ඊට අමතරව සෑම සමාසිකයකම එම පාඨමාලා ඒකක සඳහා මධ්‍ය සමාසික පරීක්ෂණයක් ද පවත්වනු ලැබේ.

## පාඨමාලාවේ ලියාපදිංචි වීම සහ ඒ සඳහා සුදුසුකම් හා අවශ්‍යතාඃ (Registration to the Course and Required Qualifications)

මෙම පාඨමාලාව සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් සහ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨ වෙබ් පිටුවෙහිද පාඨමාලාව පිළිබඳ විස්තර ඇතුලත් කිරීමෙන් අයදුම් පත් කැඳවනු ලබයි. පාඨමාලාවට විධිමත්භාවයක් ලබා දීමේ අරමුණින් සෑම වර්ෂයකම ජනවාරි මස මෙම උපාධි පාඨමාලාවේ දේශන ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් මෙසේය.

I. සමාජ විද්‍යා විෂයෙන් අර්ස 30 ඇතුළත්ව පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම හෝ
II. පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් උපාධියක් සහිතව සමාජවිද්‍යා විෂය ක්ෂේත්‍රයෙන් අර්ස 30 කට සමකල හැකි පළපුරුද්දක් හෝ පූර්ව හැදෑරීමක් කර තිබීම (රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි විය යුතුය.)
III. ඉහත I හෝ II ට සම කළ හැකි සහ රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි වෙනත් සුදුසුකමක් ලබා තිබීම.
IV. රුහුණ විශ්වවිද්‍යාලයේ සනාතන සභාවට පිළිගත හැකි පරිදි සමාජ විද්‍යා විෂය ක්ෂෙත්‍රයේ දැනුමක් සහිතව NVQL - 7 සම්පූර්ණ කර තිබීම.

## අයදුම්පත් කැඳවීම (Calling for Applications)

මහජන බැංකු ශාඛාවකට රු. 1050/- ක් ගෙවා ලබා ගත් ලදුපතෙහි පිටුපස පාඨමාලාවේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කර ඉදිරිපත් කළ යුතු වේ. අයදුම්පත් පැමිණ ලබා ගන්නේ නම් රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ පීඨ කාර්යාලය වෙත පැමිණිය යුතු වේ. අයදුම්පත් තැපෑලෙන් ලබා ගැනීමට තමන්ගේ නම හා ලිපිනය ලියූ රු 15/- මුද්දර ඇලවූ 9”X 4” ප්‍රමාණයේ ලිපි කවරයක් සමග පෙර කී පරිදි රු. 1050/- ගෙවා ලබා ගත් ලදුපත **ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපියේ වම්පස ඉහළ කෙළවරේ මෙකී පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි පිටපත් 02ක් වශයෙන් සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමග පහත සඳහන් සහතික වල සහතික කරන ලද පිටපත් 02 බැගින් පශ්චාද් උපාධි අධ්‍යයන පීඨයේ ජ්‍යෝෂ්ඨ සහකාර ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කළ යුතුය. පාඨමාලාවට තෝරා ගැනීමට කැඳවනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී අදාල සහතික වල මුල් පිටපත් ඉදිරිපත් කල යුතුය.

I. ප්‍රථම උපාධි සහතිකය
II. උප්පැන්න සහතිකය
III. පාඨමාලාව සඳහා සුදුසුකම් ලැබීමට අදාල වෙනත් සහතික
IV. පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූප 02
V. ජාතික හැඳුනුම්පතේ පිටපත් 02

## පාඨමාලා ගාස්තුව (Course fee)

මෙය ස්වයං මූල්‍යයන පාඨමාලාවකි. පාඨමාලාවෙන් උපයන අරමුදල් මගින් එහි වියදම දරනු ලැබේ. එබැවින් ලියාපදිංචි වන අපේක්ෂකයින් පහත සඳහන් ගාස්තු ව්‍යුහයට අනුගත විය යුතුය.

| | |
|---|---|
| අයදුම්පත්‍ර ගාස්තුව | රු. 1050.00 |
| පාඨමාලා ගාස්තුව | රු. 89200.00 |

(වාරික දෙකකින් ගෙවීමට අවසර ලැබේ.)

**අනෙකුත් ගාස්තු: (Other fees)**

| | |
|---|---|
| විභාග ගාස්තුව | රු. 3000.00 |
| පුස්තකාල ගාස්තුව | රු. 2000.00 |
| පුස්තකාල තැන්පතු (නැවත ගෙවන) | රු. 5000.00 |
| ලියාපදිංචිවීමේ ගාස්තුව | රු. 700.00 |
| ශිෂ්‍ය හැඳුනුම්පත් ගාස්තුව | රු. 300.00 |
| වාර්ෂික ලියාපදිංචි ගාස්තුව (පළමු වසරෙන් පසු) | රු. 1000.00 |
| අසමත්වීම නිසා නැවත පෙනී සිටීමේ ගාස්තුව (එක් ප්‍රශ්න පත්‍රයකට) | රු. 500.00 |

පාඨමාලාව සඳහා ලියාපදිංචි වන අවස්ථාවේ අදාළ මූලික ගෙවීම් කළ යුතුය. එම ගෙවීම් රුහුණ විශ්වවිද්‍යාලයේ පොදු රැස්කිරීමේ ගිණුමට බැරවන සේ ඕනෑම මහජන බැංකු ශාඛාවකින් ගෙවිය හැකිය.

## දේශන සහභාගිත්වය - (Attendance)

එක් එක් අපේක්ෂකයා අදාල දේශන පැය ප්‍රමාණයෙන් 80% ක සහභාගිත්වය සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අපේක්ෂකයින්ට අවසාන විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය (Method of Teaching- Learning)

i. විෂයේ ප්‍රාමාණිකයන් විසින් පවත්වනු ලබන විධිමත් දේශන මෙම පාඨමාලාවේ ප්‍රධාන ඉගැන්වීම් ක්‍රමයයි. ඊට අමතර ව කේවල හා කණ්ඩායම් සාකච්ඡා ක්‍රමය, පැවරුම් ලිවීම, පැවරුම් සාකච්ඡා කිරීම හා ඉදිරිපත් කිරීම සහ කාර්ය සාධන සම්මන්ත්‍රණ, වැඩමුළු, ආරාධිත දේශන යන ක්‍රමෝපායයන් භාවිත කරනු ලැබේ

ii. සෑම සති අන්තයකම සෙනසුරාදා සහ ඉරිදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වා දේශන පවත්වනු ලැබේ

iii. එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා පැය 60 ක දේශන කාලයක් වෙන් වේ

## පාඨමාලාවේ ඇගයීම් ක්‍රමය: (Method of Course Evaluation)

### විභාග පටිපාටිය

i. මෙම පාඨමාලාවට අදාළ විභාග පැවැත්වීම විශ්වවිද්‍යාල විභාග අංශය මගින් සිදු කෙරෙනු ඇත

ii. සමාසික අවසාන පරීක්ෂණ සඳහා පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය මගින් නිකුත් කරනු ලබන විභාග ප්‍රවේශ පත්‍රයක් භාවිත කළ යුතුය

iii. එක් සමාසිකයකට පාඨමාලා ඒකක තුන බැගින් පාඨමාලා ඒකක හයක ප්‍රශ්න පත්‍ර හයක් සඳහා පිළිතුරු සැපයිය යුතුය

iv. සෑම අපේක්ෂකයකුම සමාසික අවසාන විභාගයට පෙර අඛණ්ඩ ඇගයුම් සම්පූර්ණ කිරීම හා මධ්‍ය සමාසික පරීක්ෂණයට පෙනී සිටීම අනිවාර්ය වේ

### මධ්‍ය සමාසික පරීක්ෂණය

මෙය ලිඛිත පරීක්ෂණයක් වන අතර සමාසිකයක් තුළ කෙරෙන ඇගැයීමක් වේ. කාලය පැය එකහමාරකට සීමා වේ. පීඨයේ නියමයන්ට අනුව ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරු පත් ඇගයීම පාඨමාලා ඒකක භාර සමායෝජකයින් විසින් කළ යුතු වන අතර ප්‍රශ්න පත්‍ර ප්‍රමිත කරවා ගැනීමක් හෝ දෙවන වර පරීක්ෂාවක් අවශ්‍ය නොවේ.

### සමාසික අවසාන පරීක්ෂණය

මෙය ලිඛිත පරීක්ෂණයකි. කාලය පැය තුනකට (03) සීමා වේ. විභාග කටයුතු සංවිධානය, පහසුකම් සැපයීම සහ පරිපාලනය කිරීම යනාදී කටයුතු රුහුණ විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය හා විභාග අංශය විසින් කළ යුතුය. ඒ සඳහා ශාස්ත්‍රපති පාඨමාලාවේ සම්බන්ධීකාරකගේ සහයෝගය ලබා ගත යුතුය. පීඨයේ නියමයන් ට අනුව ප්‍රශ්න පත්‍ර සැකසීම හා පිළිතුරු පත් ඇගැයීම පාඨමාලා ඒකක භාර සමායෝජකයින් විසින් කළ යුතු වන අතර ප්‍රශ්න පත්‍ර ප්‍රමිත කරවා ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් පීඨයට ලබාදීම පාඨමාලාවේ සම්බන්ධීකාරක විසින් කළ යුතුය. සමාසික අවසාන පරීක්ෂණයේ පිළිතුරු පත් පළමුවර හා දෙවනවර ඇගයීම් කළ යුතු වේ. ඒ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය රුහුණ විශ්වවිද්‍යාලයේ විභාග අංශය විසින් කළ යුතුය.

**ඇගයීම් ක්‍රමය**

i. සමාසික අවසාන පරීක්‍ෂණයේ දී එක් ප්‍රශ්න පත්‍රයකට ලකුණු 60 බැගින් ලබා ගත යුතු වේ. ඉතිරි ලකුණු 40 අඛණ්ඩ ඇගයීම් සඳහා වෙන් කෙරේ. සෑම සමාසිකයකදීම එක් පාඨමාලා ඒකකයක් සඳහා එක් පැවරුමකට සහ මධ්‍ය සමාසික පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. පැවරුමට ලකුණු 20 ක් ද මධ්‍ය සමාසික පරීක්‍ෂණයට ලකුණු 20 ක් ද වශයෙන් මුළු ලකුණු 40 ක් ලබා දෙනු ඇත.

ii අඛණ්ඩ ඇගයුම්වල ස්වභාවය පහත පරිදිය.

a. පන්ති කාමර පරීක්‍ෂණය (Class room test)

b. කේවල පැවරුම් (Individual assignments)

c. කණ්ඩායම් පැවරුම් (Group assignments)

d. කණ්ඩායම් ව්‍යාපෘති (Group projects)

e. ශ්‍රව්‍ය-දෘෂ්‍ය ඉදිරිපත් කිරීම් (Audio visual presentations)

f. මධ්‍ය සමාසික පරීක්‍ෂණය (Mid-semester examination)

iii. විභාග කටයුතුවල ගුණාත්මකභාවය සහ සංගත භාවය ආරක්‍ෂා කරගැනීම සඳහා පිළිතුරු පත්‍ර පළමුවර පරීක්ෂාව සහ දෙවෙනිවර පරීක්ෂාව වශයෙන් පරීක්‍ෂකවරුන් දෙදෙනෙකු යටතේ සිදු කරනු ඇත

iv. එක් එක් පාඨමාලා ඒකකයට ලබාගත් ලකුණු ප්‍රමාණය මත අදාළ ශ්‍රේණිය (Grade) හා ශ්‍රේණි ලක්‍ෂ්‍යය (Grade point) තීරණය කරනු ලබයි. පාඨමාලාව අවසානයේදී සියළු පාඨමාලා ඒකකවල ශ්‍රේණි ලක්‍ෂ්‍යයන්හි සාමාන්‍යය (Grade Point Average - GPA) ගණනය කෙරේ. ශ්‍රේණි ලක්‍ෂ්‍යයන්හි සාමාන්‍ය ගණනය කිරීමේදී එක් එක් පාඨමාලාවේ අර්ඝ සංඛ්‍යාව ඒ ඒ පාඨමාලාව සඳහා ලබාගත් ශ්‍රේණි ලක්‍ෂ්‍යයෙන් බර තබා අංක ගණිතමය මධ්‍යන්‍යය ගණනය කරනු ලබයි. පාඨමාලාවේ අවසාන සාධන මට්ටම තීරණය කරනු ලබන්නේ මෙම ශ්‍රේණි ලක්‍ෂ්‍ය සාමාන්‍යය මතය. ශ්‍රේණි ලක්‍ෂ්‍ය සාමාන්‍යය ගණනය කරනු ලබන ආකාරය පහත පරිදි වේ

$$GPA = \frac{\sum Ci\,Gi}{\sum Ci}$$

Ci = I වැනි පාඨමාලා ඒකකය සඳහා වූ අර්ඝ සංඛ්‍යාව

Gi = I වැනි පාඨමාලා ඒකකය සඳහා ලබා ගන්නා ලද ශ්‍රේණි ලක්ෂ්‍ය වටිනාකම

පාඨමාලා ඒකකයක් සමත්වීමට අවශ්‍ය අවම ශ්‍රේණි ලක්ෂ්‍ය 2.0 ක් වේ. ඊට අඩු ශ්‍රේණි ලක්ෂ්‍යයන් ලබාගන්නා අපේක්ෂකයින් එම පාඨමාලා ඒකකයට ඊළඟ අවස්ථාවේ පෙනී සිට සාමාර්ථය ලබාගත යුතුය. කිසියම් පාඨමාලා ඒකකයක් සඳහා නැවත පෙනී සිටින අවස්ථාවක දී අපේක්ෂකයා කෙතරම් ඉහළ ලකුණු ලැබුවත් ලැබෙන ශ්‍රේණිය C පමණක් වනු ඇත

v. ප්‍රශ්න පත්‍ර ඇගයීමේදී දෙනු ලබන ලකුණු ප්‍රමාණයන්, ශ්‍රේණි සහ ශ්‍රේණි ලක්ෂ්‍යයන් පහත පරිදි වේ

| ශ්‍රේණිය | ශ්‍රේණි ලක්ෂ්‍ය වටිනාකම |
|---|---|
| A+ | 4.00 |
| A | 4.00 |
| A- | 3.70 |
| B+ | 3.30 |
| B | 3.00 |
| B- | 2.70 |
| C+ | 2.30 |
| C | 2.00 |
| C- | 1.70 |
| D+ | 1.30 |
| D | 1.00 |
| E | 0.00 |

vi. සමස්ත සාධන මට්ටම පහත පරිදි නීර්ණය කරනු ලබයි.

(a) තෙවතාවකට නොවැඩි වාර ගණනක දී සියලුම පාඨමාලා ඒකක සම්පූර්ණ කර තිබිය යුතුය

(b) සමස්ත ශ්‍රේණි ලක්ෂ්‍ය සාමාන්‍යය අවම වශයෙන් 2.0 ක් හෝ ඊට වඩා වැඩි විය යුතුය

(c) සෑම පාඨමාලා ඒකකයක් සඳහා ම අවම ශ්‍රේණි ලක්ෂ්‍යය 2.0 හෝ ඊට වඩා වැඩි ශ්‍රේණි ලක්ෂ්‍යයක් ලබා තිබිය යුතුය

vii. අපේක්ෂකයෙකුට විෂය ඒකකයකට හෝ කිහිපයකට පෙනී සිටීමට නොහැකි වූයේ නම් ඔහුට පිළිගත් වෛද්‍යවරයෙකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ හැකිය. එවිට එම වෛද්‍ය සහතිකය සඳහා ලැබෙන විශ්වවිද්‍යාල වෛද්‍ය නිලධාරී නිර්දේශය විශ්වවිද්‍යාල සනාතන සභාව අනුමත කරන්නේ නම් පමණක් අපේක්ෂකයා අදාළ පරීක්ෂණය සඳහා පළමු වරට පෙනී සිටින අවස්ථාවක් සේ සළකනු ලබයි. එසේ නොවන අවස්ථාවක පාඨමාලා ඒකකයකට හෝ කිහිපයකට පෙනී සිට අසමත් වූවා සේ සලකනු ලැබේ

**අධ්‍යයන කාර්යමණ්ඩලය (Academic Panel)**

- විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සරත් අමරසිංහ මහතා [BA(Pera.), MSc.(AIT),PhD(JNU)]
- විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ඒ.කේ.ජී. ජයසිංහ මහතා [BA(Pera.), MA(Colombo)]
- ආචාර්ය එස්.එස්. තේනබදු මහතා [BA,MPhil, PhD (Ruhuna)]
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී. ආර්. ඒකනායක මිය [BA,MPhil(Ruhuna)]
- ආචාර්ය ගයාත්‍රි විජේසුන්දර මිය [BA(Colombo), MSSC, PhD (Kelaniya)]
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටී.එම්. විජේකෝන් බණ්ඩා මහතා [BA,MA(Pera.), MPhil(Ruhuna)]
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එන්.වී.ජී.ඒ. හේමන්ත කුමාර මහතා [BA(Ruhuna), MA(Pera.), MPhil (Ruhuna)]
- ආචාර්ය උපාලි පන්නිලගේ මහතා [BA, Mphil, PhD (Ruhuna), PGDip(Colombo)]
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී.කේ.එම්. දිසානායක මිය [BA, MPhil(Ruhuna)]
- ආචාර්ය දූෂ්මන්ති සිල්වා මිය [BA(Pera.), MA(JNU), PhD(Tribhuvan)]
- ආචාර්ය තිලක් විජේසුන්දර මහතා [BA(Ruhuna), MA(JNU),PhD(China)]
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සුරංජිත් ගුණසේකර මහතා [BA,MA(Pera.)] MA(Tribhuvan)
- කථිකාචාර්ය උපුල් සංජීව විජේපාල මහතා [BA (Ruhuna),MA (India), PGDip(India)]
- කථිකාචාර්ය සමිත උදයංග මහතා [BA (Pera.), BIT (Colombo), MA (Pera.)]
- ආචාර්ය පී.පී.ටී.එස්. හේමකුමාර මහතා [BA (Colombo), PGDip (Moratuwa), MSc (AIT Thailand), PhD (USM)]
- ආචාර්ය එස්.එල්.ජේ. ප්‍රනාන්දු මහතා [BA, MPhil (Ruhuna), RS & GIS (IIRS, India), PhD (USM)]
- ආචාර්ය දර්ශණ බණ්ඩාර මහතා [BA(Colombo), LLB(OUSL), PG Dip.in Heritage Studies, MA(PGIAR), PhD(Ruhuna)]
- කථිකාචාර්ය ඩබ්ලිව්. එම්. රොහාන් ලක්සිරි මහතා [BBA (Ruhuna), PDBA (Ruhuna), MSc (Agder, Norway)]

## සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව

## විස්තරාත්මක විෂය නිර්දේශය

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

**පාඨමාලා ඒකකය** : සමාජවිද්‍යාත්මක ක්‍රමවේදය

**පාඨමාලා සංකේතය** : SOC 6141

**අර්ඝ ප්‍රමාණය** : 04

**දේශන පැය** : 60

**ඇගයීම් ක්‍රමය** :

- අඛණ්ඩ ඇගයීම් 20%
  (පන්ති කාමර පරීක්ෂණ, කණ්ඩායම් හා තනි පුද්ගල පැවරුම්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්)
- මධ්‍ය සමාසික පරීක්ෂණය 20%
- සමාසික අවසාන පරීක්ෂණය 60%
- එකතුව 100%

### 02. පාඨමාලාවේ අරමුණු

- සමාජය හැදෑරීම සඳහා විද්‍යාත්මක ක්‍රමය භාවිතයේ ප්‍රයෝජන සහ සීමා හඳුනාගැනීමට මඟ පෙන්වීමක් ලබා දීම
- සමාජ තත්ත්වයන් සහ ප්‍රපංචයන් අධ්‍යයනය සඳහා භාවිත කෙරෙන සමාජවිද්‍යාත්මක පර්යේෂණ ක්‍රම පිළිබඳව මනා අවබෝධයක් ලබා දීම
- සමාජය හැදෑරීමේදී නිවැරදි පර්යේෂණ ක්‍රම භාවිත කිරීමේ පරිචය ලබා දීම

### 03. අපේක්ෂිත ප්‍රතිඵල

- විද්‍යාත්මක ක්‍රමයේ දාර්ශනික පසුබිම සහ සමකාලීන සමාජය අධ්‍යයනයෙහිලා විද්‍යාත්මක ක්‍රමයේ ප්‍රයෝජන සහ සීමා අවබෝධ කර ගැනීම

- සමාජවිද්‍යාත්මක පර්යේෂණ සැලසුම් පිළිබඳව අවබෝධය ලබා ගැනීම
- සමාජවිද්‍යාත්මක පර්යේෂණවල දී භාවිත කෙරෙන දත්ත රැස් කිරීමේ සහ දත්ත විශ්ලේෂණය කෙරෙන ශිල්ප ක්‍රම විමර්ශනාත්මකව පැහැදිලි කිරීමේ කුසලතාව ලබා ගැනීම
- පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ වාර්තා පිළියෙල කිරීමේ කුසලතාව ලබා ගැනීම

## 04. පාඨමාලාවේ අන්තර්ගතය

- **විද්‍යාත්මක ක්‍රමය හැඳින්වීම**

  විද්‍යාත්මක ක්‍රමයේ දාර්ශනික පසුබිම
  සමාජවිද්‍යාව විද්‍යාත්මක විෂයක් ලෙස හඳුනා ගැනීම
  විද්‍යාත්මක ක්‍රමය භාවිතයේ සීමා සහ එයට එරෙහි විවේචන

- **සමාජවිද්‍යාත්මක පර්යේෂණ හැඳින්වීම**

  පර්යේෂණ ක්‍රමවේදය හැඳින්වීම- න්‍යායන් සහ ක්‍රමවේදය
  සමාජවිද්‍යාත්මක පර්යේෂණ සිදු කිරීමේ අරමුණු
  සමාජවිද්‍යාත්මක පර්යේෂණවල ප්‍රයෝජන
  පර්යේෂණ ආචාරධර්ම

- **සමාජවිද්‍යාත්මක පර්යේෂණ සැලසුම් කිරීම**

  පර්යේෂණ ගැටළුවක් හඳුනා ගැනීම සහ අර්ථකථනය
  උපන්‍යාස ගොඩනැංවීම සහ පරීක්ෂා කිරීම
  සාහිත්‍ය විමර්ශණය
  පර්යේෂණ යෝජනාවලියක් පිළියෙල කිරීම

- **සමාජවිද්‍යාත්මක පර්යේෂණ ප්‍රභේද**

  පර්යේෂණ වර්ගීකරණය (මූලික පර්යේෂණ සහ ව්‍යවහාරික පර්යේෂණ හැඳින්වීම)
  විස්තරාත්මක පර්යේෂණ (හැඳින්වීම, භාවිතය සහ සීමා)
  ඓතිහාසික පර්යේෂණ(හැඳින්වීම, භාවිතය සහ සීමා)
  අත්හදාබැලීමේ පර්යේෂණ(හැඳින්වීම, භාවිතය සහ සීමා)

- **පර්යේෂණ සැලසුම්**

  පර්යේෂණ සැලසුම් හැඳින්වීම සහ නිර්වචනය
  සමීක්ෂණ සැලැස්ම
  ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්ම
  ප්‍රත්‍යක්ෂ අධ්‍යයන සැලැස්ම

- **සමාජවිද්‍යාත්මක පර්යේෂණවල දී නියැදීම් සහ නියැදිකරණය**

  නියැදීම් පිළිබඳ හැඳින්වීම

  නියැදියක් තෝරා ගැනීම සහ එහිදී සැලකිය යුතු කරුණු

  නියැදි වර්ග (සසම්භාවී සහ සසම්භාවී නොවන නියැදි)

- **පර්යේෂණවල දී දත්ත/තොරතුරු භාවිතය**

  දත්ත සහ දත්ත වර්ගීකරණය හැඳින්වීම

  ගුණාත්මක සහ ප්‍රමාණාත්මක දත්ත (හැඳින්වීම, භාවිතයේ ප්‍රයෝජන සහ සීමා)

  ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත (හැඳින්වීම, භාවිතයේ ප්‍රයෝජන සහ සීමා)

- **සමාජවිද්‍යාත්මක පර්යේෂණවල දී දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම සහ මෙවලම්**

  නිරීක්ෂණ ( සහභාගී, සහභාගී නොවන, ඍජු,වක්‍ර, ව්‍යුහගත, ව්‍යුහගත නොවන)

  සාකච්ඡා ((අ)සම්මුඛ සාකච්ඡා-ව්‍යුහාත්මක (ආකෘතිගත), ව්‍යුහාත්මක නොවන සහ ගැඹුරු සම්මුඛ සාකච්ඡා, (ආ) කුඩා කණ්ඩායම් සාකච්ඡා, (ඇ) නාබිගත කණ්ඩායම් සාකච්ඡා)

  ප්‍රශ්ණාවලි මෙවලම

  දත්ත රැස්කිරීමේ සහභාගීත්ව ක්‍රම ( සහභාගීත්ව ගැමි පිවිසුම් ක්‍රමවේදය)

- **දත්ත සැකසීම, වර්ගීකරණය සහ අර්ථකතනය**

  දත්ත සැකසීම සහ වර්ගීකරණය හැඳින්වීම

  දත්ත අර්ථකතනය කිරීම

- **දත්ත විශ්ලේෂණය සහ වාර්තාකරණය**

  දත්ත විශ්ලේෂණය සඳහා භාවිත කරන ගුණාත්මක ක්‍රම (හැඳින්වීම, ප්‍රයෝජන සහ සීමා)

  දත්ත විශ්ලේෂණය සඳහා භාවිත කරන ප්‍රමාණාත්මක ක්‍රම (හැඳින්වීම, ප්‍රයෝජන සහ සීමා)

  පර්යේෂණ වාර්තාවක් පිළියෙල කිරීම

## 7. නිර්දේශිත කියවීම්

උයන්ගොඩ, ජයදේව (2010) සමාජීය - මානව විද්‍යා පර්යේෂණ, සමාජවිද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ

උයන්ගොඩ, ජයදේව (2011) සමාජවිද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම සමාජවිද්‍යාඥයින්ගේ සංගමය, කොළඹ

ජයසිංහ ඒ.කේ.ජී. සමාජවිද්‍යා විධික්‍රම (2005) එස්. ගොඩගේ සහෝදරයෝ , කොළඹ

ධර්මසිරි මර්වින් ලාල් (2004) සමාජීය විද්‍යා පර්යේෂණ, කර්තෘ ප්‍රකාශන

සිල්වා, අමරසිරි (2010) සමාජවිද්‍යා පර්යේෂණ ක්‍රමවේදය, කර්තෘ ප්‍රකාශන, පේරාදෙණිය

හේමන්ත කුමාර එන් .වී.ජී. (2011) සමාජවිද්‍යා ප්‍රවේශය, රුහුණු අධ්‍යයන කවය (පිටු 302-368), ගාල්ල

Bryman, A (2004) Social Research Methods, New York: Oxford University Press.

Keith F. Punch (1998) Introduction to Social Research: Qualitative & Quantitative Approaches London: Sage.

Kothari C.K (2004) Research Methodology, New Delhi: New Age International (Pvt) Ltd Publishers

Lawrence Neumann W (2006) Social Research Methods: Qualitative and Quantitative Approaches, Pearson Education Inc.

Martyn Denscombe (1999) The Good Research Guide for Small-Scale Social Research, New Delhi: Viva Books Pvt.

Pelto and Pelto (1978) Anthropological Research, Cambridge University Press.

Sharma, M (2004) Research Methodology, New Delhi: Anmol Publication (Pvt) Ltd.

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

| | |
|---|---|
| **පාඨමාලා ඒකකය** | : උසස් සමාජවිද්‍යාත්මක න්‍යාය |
| **පාඨමාලා සංකේතය** | : SOC 6142 |
| **අර්ඝ ප්‍රමාණය** | : 04 |
| **දේශන පැය** | : 60 |
| **ඇගයීම් ක්‍රමය** | : |

- අඛණ්ඩ ඇගයීම් 20%
  (පන්ති කාමර පරීක්ෂණ, කණ්ඩායම් හා තනි පුද්ගල පැවරුම්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්)
- මධ්‍ය සමාසික පරීක්ෂණය 20%
- සමාසික අවසාන පරීක්ෂණය 60%
- එකතුව 100%

**පාඨමාලාවේ අරමුණු**

i. උසස් සමාජවිද්‍යාත්මක න්‍යායන් හා එළඹුම් පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීම
ii. සමාජ සංසිද්ධීන් විග්‍රහ කිරීමේදී සමාජවිද්‍යා න්‍යායාත්මක දැනුමක් ලබා දීම

**අපේක්ෂිත ප්‍රතිඵල**

i. විද්‍යාර්ථීන්ගේ සමාජවිද්‍යාත්මක පරිකල්පන කුසලතාව වර්ධනය කිරීම
ii. සමාජ සංසිද්ධීන් හා සමාජ ක්‍රියාවලීන් විශ්ලේෂණය කිරීම සඳහා විවිධ න්‍යායාත්මක එළඹුම් යොදා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම

**පාඨමාලාවේ අන්තර්ගතය**

01. සමාජය පිළිබඳ සම්භාව්‍ය සමාජවිද්‍යා න්‍යායාත්මක පර්යාවලෝකය
02. ක්ෂුද්‍ර සමාජවිද්‍යා න්‍යායාත්මක පර්යාවලෝකනය
03. සාර්ව සමාජවිද්‍යා න්‍යායාත්මක පර්යාවලෝකනය
04. කෘත්‍යවාදී න්‍යාය
05. ව්‍යුහවාදය හා පශ්චාත් ව්‍යුහවාදය
06. මානවවංශ ක්‍රමවේදය හා ප්‍රපංච විද්‍යාත්මක සමාජවිද්‍යාව
07. විචාරාත්මක න්‍යාය
08. නූතනත්වය හා ඊට එරෙහි විවේචන
09. පශ්චාත් නූතනවාදය
10. ව්‍යුහකරණය

**නිර්දේශිත කියවීම්**

දෝෂි, එස්.එල්. (2016) නූතනත්වය, පශ්චාත් නූතනත්වය සහ නව සමාජවිද්‍යාත්මක න්‍යාය (පරි. ද සිල්වා ප්‍රේම කුමාර හා අත්තනායක අබේරත්න) ෆාස්ට් පබ්ලිෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් කොළඹ.)

Abraharn, Fand Morgan J.H. (2013), Sociological Thought, Macmillan Publishers India Ltd. New. Delhi: Macmillan.

Ritzier, (1996): Sociological Theory: The McGraw Him Companies, Inc., New York.

Chakravorty, B.M. (2009), Sociology: Theory, Methodology and Concepts: London, New Central Book Agency (P) Ltd.

Elliott, A. (2009). Contemporary Social Theory, Routledge London.

Abraham, F.M. (2004). Modern Sociological Theory: An Introduction Oxford: Oxford University Press.

Best, S (2003) A Beginners' Guide to Social Theory London: SAGE Publication Ltd.

Adams, B.N. and Sydie R.A. (2001). Sociological Theory: London, Pine Forge Press.

Shamrock, W.W. Hughes J.A. and Martin, P. J. (2003) Understanding Modern Sociology, London: SAGE Publications.

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**
**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

| | | |
|---|---|---|
| **පාඨමාලා ඒකකය** | : | පර්යේෂණ යෝජනාවලිය |
| **පාඨමාලා සංකේතය** | : | SOC 6123 |
| **අර්ඝ ප්‍රමාණය** | : | 02 |
| **අධීක්ෂණ පැය** | : | 30 |

## 1. අධ්‍යයන මාතෘකාව සහ අධ්‍යයන ගැටළුව තෝරා ගැනීම

SOC 6123 පාඨමාලාවට අදාල ස්වාධින පර්යේෂණ යෝජනාවලිය සඳහා යෝජිත පර්යේෂණ මාතෘකාව සිසුන් විසින් යෝජනා කළ යුතු වේ. එහිදී සමාජවිද්‍යාත්මක අගයක් සහිත ගැටලුවක් තෝරාගැනීම කෙරෙහි මූලික අවධානය යොමු කළ යුතුය, තෝරාගනු ලබන මාතෘකාවට අදාළව පර්යේෂණ ගැටළුවක් ඇති බව නිවැරදිව හඳුනාගැනීමට අවධානය යොමු කිරීමද විශේෂයෙන් වැදගත් වේ. පර්යේෂණ මාතෘකාව හැකිතාක් කෙටි විය යුතු අතර එකී අධ්‍යයන ගැටළුව පටු (narrow) සහ පර්යේෂණාත්මක ගුණයෙන් (researchable) යුක්ත විය යුතුය.

## 2. පර්යේෂණ යෝජනාවලිය (Research Proposal) පිළියෙළ කිරීම

සිය අධ්‍යයනයට අදාළ පර්යේෂණ යෝජනාව අදාළ අධ්‍යයන වර්ෂයේ පළමු සමාසිකයේ හතරවන සතිය (4) අවසන් වීමට පෙර විෂය සම්බන්ධිකාරක වෙත භාරදිය යුතුය. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ යෝජනාව පහත සඳහන් ආකෘතිය අනුගමනය කරමින් සකස් කළ යුතුය.

i. පර්යේෂණ මාතෘකාව පිළිබඳ හැඳින්වීම
ii. අධ්‍යයන ගැටළුව හැඳින්වීම
iii. අධ්‍යයනයේ වැදගත්කම
iv. අධ්‍යයනයේ අරමුණ හෝ අරමුණු
v. ක්‍රමවේදය (නියැදිය, දත්ත රැස්කිරීමේ තාක්ෂණ විධීන්)
vi. අධ්‍යයන ප්‍රදේශය
vii. සාහිත්‍ය විමර්ශනය
viii. අධ්‍යයනයේ සීමා
ix. ඉදිරි පරිච්ඡේද, පෙළගැස්ම
x. කාලරාමුව
xi. පරිශීලන ග්‍රන්ථ

ඉහත ආකෘතිය අනුගමනය කරමින් ඔබ විසින් පිළියෙල කරනු ලබන පර්යේෂණ යෝජනාව A4 ප්‍රමාණයේ පිටු 10 කට හෙවත් වචන 2500 සීමා විය යුතුය.

**3. ස්වාධීන පර්යේෂණ යෝජනාවලිය අදාළ උපදේශකත්වය**

එක් එක් අපේක්ෂකයා සඳහා ඔහු/ ඇය විසින් තෝරාගනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව සමාජවිද්‍යා අධ්‍යයන අංශය මගින් උපදේශකවරයකු/ උපදේශකවරියක පත්කරනු ලැබේ. උපදේශකවරයාගේ නිර්දේශය මත යෝජිත පර්යේෂණ මාතෘකාවෙහි වෙනස්කම් කර ගැනීමට අවකාශයක් ඇත.

සෑම අපේක්ෂකයකු ස්වකීය උපදේශකවරයා හමුවී අවශ්‍ය උපදෙස් ලබා ගැනීම අනිවාර්ය වේ. ඒ බව (හමුවීම) තහවුරු කිරීම සඳහා උපදේශකවරයාගේ නිර්දේශය සහිත පැමිණීමේ ලේඛණයක් එක් එක් අපේක්ෂකයා විසින් පවත්වාගෙන යා යුතු වේ. යෝජනාවලිය ඇගයීමේ දී සහ වාචික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන අතර එකී පර්යේෂණ යෝජනාවලිය වාචික පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

**4. ස්වාධින පර්යේෂණ යෝජනාවලිය පිළියෙල කිරීම**

සමාජවිද්‍යා අධ්‍යනාංශය මගින් හඳුන්වා දී ඇති පොදු නිර්ණායකයනට අදාළව යෝජනාවලිය පිළියෙළ කළ යුතු වේ.

i. අකුරු ප්‍රමාණය (Font Size) : 12
ii. පිටුවේ ප්‍රමාණය : A4
iii. පේළි අතර පරතරය : 15
iv. සීමා : වම 1.5'', දකුණ 1'', ඉහළ 1'', පහළ 1''

**6. ස්වාධින පර්යේෂණ යෝජනාවලිය ඇගයීම් පටිපාටිය**

පළමු සමාසික අවසාන පරීක්ෂණය සඳහා අදාළ ලකුණු 100 පහත සඳහන් නිර්ණායකයන්ට අනුව හිමිවනු ඇත.

| නිර්ණායකයන් | ලකුණු |
|---|---|
| i. පර්යේෂණ සැලැස්ම සඳහා | 30 |
| ii. සාහිත්‍ය විමර්ශනය සඳහා | 30 |
| iii. ඉදිරිපත් කිරීම | 20 |
| iv. උපදෙස් නිසි පරිදි ලබා ගැනීම | 10 |
| v. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය සකස් කිරීම | 10 |
| | 100 |

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

**පාඨමාලා ඒකකය** : සංවිධාන චර්යාව

**පාඨමාලා සංකේතය** : SOC 6144

**අර්ස ප්‍රමාණය** : 04

**දේශන පැය** : 60

**ඇගයීම් ක්‍රමය** :

- අඛණ්ඩ ඇගයීම් 20%
  (පන්ති කාමර පරීක්ෂණ, කණ්ඩායම් හා තනි පුද්ගල පැවරුම්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්)
- මධ්‍ය සමාසික පරීක්ෂණය 20%
- සමාසික අවසාන පරීක්ෂණය 60%
- එකතුව 100%

**පාඨමාලාවේ අරමුණු:**

i. සංවිධාන චර්යාව පිළිබඳ න්‍යායාත්මක අවබෝධයක් ලබාදීම

ii. මානව චර්යාව වඩාත් ඵලාදයී සංවිධාන පරිසරයක් තුළ ක්‍රියාකාරී වන ආකාරය පිළිබඳ දැනුවත් කිරීම

iii. සංවිධානයක් තුළ තනි පුද්ගල සහ සමූහ චර්යාව ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කිරීම

**අපේක්ෂිත ප්‍රතිඵල**

i සංවිධාන චර්යාව පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබා ගැනීම

ii. පුද්ගල චර්යාව හා සංවිධාන පද්ධතිය අතර ඇති සම්බන්ධතාවය අවබෝධ කරගැනීම

ii. සංවිධානයක් තුළ හෝ රැකියා ස්ථානයක් තුළ ඇතිවන ගැටුම් කළමණාකරණය කිරීමට අවශ්‍ය දැනුම ලබා ගැනීම

**පාඨමාලාවේ අන්තර්ගතය**

01. සංවිධාන චර්යාව පිළිබඳ හැඳින්වීම
02. සංවිධාන චර්යාව පිළිබඳ ප්‍රවේශ: විද්‍යාත්මක කළමණාකරණය සහ සංවිධාන පිළිබඳ මානුෂවාදීප්‍රවේශය
03. අභිප්‍රේරණය හා අභිප්‍රේරණ න්‍යායන්
04. සංජානනය තීරණ ගැනීම ඇගයීම් ආකල්ප හා වෘත්තීමය ස්වභාවය සේවක
05. සම්පත් කළමනාකරණය හා ප්‍රතිපත්තීන්
06. සංවිධාන සමූහ ගොඩනැගීමේ ක්‍රියාවලිය
07. නායකත්ව චර්යාව හා න්‍යායයන්
08. ආතති කළමණාකරණය හා ක්‍රමවේදයන්
09. අන්තර් සමූහ සබඳතා හා ගැටුම්: සංවිධාන තුළ අර්බුධ කළමණාකරණය
10. සංවිධානය තුළ බලය හා දේශපාලනය ක්‍රියාත්මක වන ආකාරය
11. සංවිධාන සංස්කෘතිය, වෙනස හා සංවර්ධනය

**නිර්දේශිත කියවීම්**


Veluri. V.S. Sarma, (2009) Organizational Behavior: An Interactive Learning Approach, Jaico Publishing Hours: Mumbai.

Chand and S. Jith (2004) Organizational Behavior, Vikas Publishing House, New Delhi.

Harigopal, K (2006) Management of Organizational Change, Response Books, New Delhi.

Jain, G.R. and Tankan, A (2006) Sharing Organizational Strategies, Response Books, New Delhi.

All port, G.W. (1961) Pattern and Growth on Personality, Holt Rinehart and Winston, New York

Morgan, Gareth (1986) Images of Organizations, Sage Publications UK.

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

| | |
|---|---|
| **පාඨමාලා ඒකකය** | : සංවර්ධන සමාජවිද්‍යාව |
| **පාඨමාලා සංකේතය** | : SOC 6241 |
| **අර්ඝ ප්‍රමාණය** | : 04 |
| **දේශන පැය** | : 60 |
| **ඇගයීම් ක්‍රමය** | : |

- අඛණ්ඩ ඇගයීම් 20%
  (පන්ති කාමර පරීක්ෂණ, කණ්ඩායම් හා තනි පුද්ගල පැවරුම්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්)
- මධ්‍ය සමාසික පරීක්ෂණය 20%
- සමාසික අවසාන පරීක්ෂණය 60%
- එකතුව 100%

**පාඨමාලාවේ අරමුණු:**

i. සංවර්ධන න්‍යායයන් පිළිබඳ ගැඹුරු දැනීමක් සැපයීම
ii. ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් සහිතව තුන්වැනි ලෝකයේ සංවර්ධනයට අදාළ ප්‍රධාන ගැටලු පිළිබඳ දැනුමක් සපයාදීම

**අපේක්ෂිත ප්‍රතිඵල**

i. සංවර්ධන සමාජවිද්‍යාවෙහි අඩංගු විවිධ න්‍යායයන් හා ප්‍රවේශ අවබෝධ කරගැනීම
ii. මෙම න්‍යායයන් හා ප්‍රවේශ සංවර්ධනයෙහි ප්‍රායෝගික තත්වයන්ට අදාළ කර ගැනීමට හැකියාව ලැබීම

**පාඨමාලාවේ අන්තර්ගතය**

**1. සංවර්ධන සමාජවිද්‍යාව හැඳින්වීම**

i. සංවර්ධන සමාජවිද්‍යාවේ ප්‍රභවය
ii. සංවර්ධන සමාජවිද්‍යාව පිළිබඳ අර්ථකථන
iii. සංවර්ධන සමාජවිද්‍යාවේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය

**02. සංවර්ධන න්‍යායයන්**

i. නවීකරණ න්‍යාය

ii. පරාධීන න්‍යාය

**03. සංවර්ධන දර්ශක**

i. සංවර්ධනය පිළිබඳ සාම්ප්‍රදායික දර්ශක

ii. දළ ජාතික නිෂ්පාදන මිණුම (GNP)

iii. භෞතික ජීවන තත්ත්ව දර්ශකය (PQLI)

iv. මානව සංවර්ධන දර්ශකය (HDI)

v. මානව නිදහස් දර්ශකය (HFI)

vi. මානව දරිද්‍රතා දර්ශකය (HPI)

vii. ස්ත්‍රී පුරුෂ සමාජභාවීය දර්ශකය (GRDI)

viii. මානව සංතුෂ්ටි දර්ශකය (HHI)

**04. සංවර්ධනයෙහි භාවිතය සහ වෙනස**

i. දුගීභාවය දුරු කිරීම

ii. තිරසාර ජීවිකා වෘත්ති සංවර්ධනය

iii. සහභාගීත්වය

iv. බලමුළු ගැන්වීම

v. ප්‍රජා සංවර්ධනය

vi. රාජ්‍ය නොවන සංවිධාන

**05. පාරිසරික සංවර්ධනය හා තිරසාර සංවර්ධනය**

i. පාරිසරික සංවර්ධනය හා තිරසාර සංවර්ධනයෙහි ප්‍රභවය හා අර්ථ නිරූපණය

ii. ආර්ථික සුසමාදර්ශය හා පාරිසරික සුසමාදර්ශය

iii. තිරසාර සංවර්ධනයේ ප්‍රභේද (දුබල තිරසාරත්වය හා ප්‍රබල තිරසාරත්වය)

iv. තිරසාර සංවර්ධන දර්ශක

v. තිරසාර සංවර්ධනය පිළිබඳ ආකෘති (මැග්නාග්ටන් ආකෘතිය, බාබියර් සහ මාර්කැන්ඩියාගේ ආකෘතිය, පියර්ස් සහ ටර්නර්ගේ ආකෘතිය)

06. ගෝලීයකරණය හා සංවර්ධනය

i. ගෝලීයකරණය අර්ථ දැක්වීම

ii. සංවර්ධන භාවිතය, ආධාර කර්මාන්තය හා ගෝලීයකරණය

iii. ගෝලීය සංවර්ධනය සහ පශ්චාත් ව්‍යුහවාදී විවේචන

**නිර්දේශිත කියවීම්**


Amarasinghe, Sarath (2001) - Mobilizing Rural Women for Development, Colombo, RDTRI.

Beatty Bronwyn and Gibson Lorena (2009) – Cultural & Development: New Paradigms, Knowledge notes – Synexe.

Beyond Economic growth: An Introduction to Sustainable Development (2004) – Washington, The World Bank.

Briggs, J. (2005) the Use of Indigenous Knowledge in Development: Problems in Development Studies 5(2):99-114. University of Glasgow.

Chayad Gundy I et al (2004) – Global Urban Development: Singapore Metropolitan Economic Strategy Report – Singapore Economic Transformation Prague, Global Urban Development.

Clark Jeffrey (2000) - Civil Society, NGOs, and Development in Ethiopia: A Snapshot View, Washington, D.C. The World Bank 2000.

Khondker Habibul Haque (2004) – Globalization as Globalization: Evolution of a Sociological Concept, Bangladesh e-journal of Sociology, Vol. 01. No.02.

Ranaweera Banda, R.M. (2013) – Transnational Culture and Export Knowledge, Author Publication

Rosset, Peter (2000) – Lessons from the Green Revolution www.soc.iastate.edu/sapp/greenrevolution.pdf.

Rostow, W.W. (1960) – The Stage of Economic Growth: A Non-Communist Manifesto, Cambridge University Press

Sen Amartya (1999), Development as Freedom Oxford, Oxford University Press.

Wijesundara, Tilak (2010) – Contextualizing Poverty in South Asia Countries in Asia-Pacific Journal of Social Sciences Vol II (I) January – June 2010,1 – 38, India, Sri Venkateswara University.

අයිවන්, වික්ටර් (2010) - *මට පෙනෙන හැටි*, මහරගම, රාවය ප්‍රකාශකයෝ.

වීරසිංහ ටියුඩර් (2015) - *ගෝලීය සමාජය හා එහි දෘෂ්ටිවාදය*, ආණමඩුව, තෝතැන්න පබ්ලිෂින් හවුස්

ස්ටිග්ලිෂ්, ජෝසෆ් ඊ (2007) - *ගෝලීයකරණය සහ එහි අසහනයෝ*, කොළඹ, සාමයික ආයතනය.

බණ්ඩාරගේ අසෝකා, (2005) - *ශ්‍රී ලංකාවේ යටත් විජිත වාදය*, කොළඹ, ස්ටැම්ෆර්ඩ්, ලේක් ප්‍රකාශන

ජයවර්ධන, කුමාරි (2008) - *සොක්කන් ලොක්කන් වූ වගයි* ඃ ශ්‍රී ලංකාවේ යටත්විජිත ධනේශ්වරයේ නැගීම, කොළඹ, සමාජවිද්‍යාඥයින්ගේ සංගමයග

ජයකොඩි, සරත් කේ. (2008) - ශ්‍රී ලංකාව හා තිරසාර සංවර්ධනය, කර්තෘ ප්‍රකාශන.

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

**පාඨමාලා ඒකකය** : සමාජ ගැටළු

**පාඨමාලා සංකේතය** : SOC 6242

**අර්ඝ ප්‍රමාණය** : 04

**ඇගයීම් ක්‍රමය**

- අඛණ්ඩ ඇගයීම් 20%
  (පන්ති කාමර පරීක්ෂණ, කණ්ඩායම් හා තනි පුද්ගල පැවරුම්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්)
- මධ්‍ය සමාසික පරීණය 20%
- සමාසික අවසාන පරීක්ෂණය 60%
- **එකතුව 100%**

## 2. පාඨමාලාවේ අරමුණු

- නූතන සමාජයෙහි පවතින සමාජ ගැටළු පිළිබඳව අවබෝධයක් ලබාදීම
- සමාජ ගැටළු අධ්‍යයනය කිරීම සඳහා න්‍යායාත්මක රාමු උපයෝගී කර ගැනීම පිළිබද දැනුවත් කිරීම
- සමාජ ගැටලු මගින් ඇතිකරන සමාජයීය ප්‍රතිවිපාක පිළිබද දැනුවත් කිරීම
- සමාජ ගැටළු විසදා ගැනීම සඳහා යොදා ගත හැකි පිළියම් පිළිබඳව අවබෝධයක් ලබාදීම

## 3. අපේක්ෂිත ප්‍රතිඵල

- සමාජය මුහුණ දී ඇති ගැටලුකාරී තත්වයන් පිළිබද අවබෝධය ලබා ගැනීම
- සමාජ ගැටලු හැදෑරීම සදහා න්‍යායාත්මක ප්‍රවේශයන් උපයෝගී කර ගැනමේ හැකියාව ඇතිවීම
- සමාජ ගැටළු හටගන්නා ආකාරය සහ ඒවායේ සමාජ ප්‍රතිවිපාක අවබෝධ වීම
- සමාජ ගැටළු විසදා ගැනීම සඳහා පවතින ක්‍රියාමාර්ගයන් පිළිබඳ දැනුවත් වීම

## 4. පාඨමාලාවේ අන්තර්ගතය

- **සමාජ ගැටළු පිළිබඳව හැඳින්වීම**

  සමාජ ගැටළු නිර්වචනය හා අර්ථ දැක්වීම

  සමාජ ගැටළු හැදෑරීම හා සම්බන්ධ න්‍යායාත්මක ප්‍රවේශයන් ඃ කෘත්‍යවාදීන්‍යාය (Functionalist Theory), ගැටුම්වාදී න්‍යාය (Conflict Theory), සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදය (Symbolic Interactionist Theory)

  සමාජ ගැටළු විසඳා ගැනීම සඳහා ඉහත දෘෂ්ටිවාදීන් දක්වන ලද අදහස් පරීක්ෂා කර බැලීම

  සමාජ ගැටළු වර්ගීකරණය ඃ සමාජ ප්‍රතිමාන බණ්ඩනය (Norm Violation), සමාජ තත්වයන් (Social conditions)

- **දරිද්‍රතාවය සහ සමාජය**

  දරිද්‍රතාවය පිළිබඳ නිර්වචනයන් හා අර්ථ දැක්වීම්

  දරිද්‍රතාවයෙහි ස්වභාවයන් ඃ නිරපේක්ෂ දුගීභාවය (Absolute poverty), සාපේක්ෂ දුගීභාවය (Relative poverty)

  දරිද්‍රතාවය කෙරෙහි බලපාන සාධක ඃ ආර්ථික සාධක, ආර්ථික නොවන සාධක.

  ගෝලීය දරිද්‍රතාවය සහ ශ්‍රී ලංකාව තුළ දරිද්‍රතාවය

  දරිද්‍රතාවය හා බැඳුණු සමාජ ගැටලු ඃ පුද්ගල බද්ධ ගැටලු, සමාජබද්ධ ගැටලු

  දරිද්‍රතාව පිළිබඳ ගැටළුවලට පිළියම් ලෙස ව්‍යුහ කෘත්‍යවාදී, ගැටුම්වාදී සහ සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදී විග්‍රහයන්

- **අපගාමී චර්යාවන් සහ සමාජ විසංවිධානය**

  අපගාමී චර්යාව පිළිබඳ නිර්වචනය හා අර්ථ දැක්වීම

  අපගාමීචර්යාවර්ගීකරණයඃ අපරාධ(Crime), බාලඅපරාධ(Juvenile delinquency), ස්ත්‍රීදූෂණ(Rape), ගණිකාවෘත්තිය(Prostitution), ළමා අපයොජන(Child abuse), මානසික අක්‍රමතා(Mental disorders), අපගාමීත්වය තුළින් මතුවන සමාජ ගැටලු

- **අන්තරායකර ඖෂධයන්ට ඇබ්බැහි වීම**

  අන්තරායකර ඖෂධ පිළිබඳ නිර්වචනය කිරීම

  අන්තරායකර ඖෂධ ඇබ්බැහිය පිළිබඳව ජීවවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක හා සමාජවිද්‍යාත්මක විග්‍රහයන් පරීක්ෂා කිරීම

  අන්තරායකර ඖෂධයන්ට ඇබ්බැහිවීම ආශ්‍රිත සමාජ ගැටළු විග්‍රහ කිරීම

- **වියපත්භාවය**

  වියපත්වීම සමාජ ගැටළුවක් ලෙස නිර්වචනය කිරීම හා අර්ථ දැක්වීම
  වියපත්වීම සහ සමාජ අසමානතාවය පිළිබඳ ව්‍යුහකෘත්‍යවාදී, ගැටුම්වාදී සහ සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදී විග්‍රහයන් පරීක්ෂාකිරීම
  වියපත්වීම ආශ්‍රිතව පැන නැගී ඇති සමාජ ගැටළු හඳුනාගැනීම

- **ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආශ්‍රිත සමාජ අසමානතාවය**

  ස්ත්‍රී පුරුෂ සමාජ අසමානතාවය සමාජ ගැටළුවක් ලෙස විග්‍රහ කිරීම
  සමාජානුයෝජනය හා ස්ත්‍රී පුරුෂ සමාජ අසමානතාවය
  ස්ත්‍රී පුරුෂ අසමානතාවය ගොඩනැගීම පිළිබඳ හා ඊට විසඳුම් ලෙස ව්‍යුහකෘත්‍යවාදී, ගැටුම්වාදී සහ සංකේතාත්මක අන්තර් ක්‍රියාවාදී විග්‍රහයන්
  වත්මන් සමාජයෙහි ස්ත්‍රී පුරුෂ අසමානතාව හේතුවෙන් ගොඩනැගී ඇති සමාජ ගැටලු,වැටුප් විෂමතාව, ලිංගික අතවරයන්, ගෘහස්ත ප්‍රචණ්ඩත්වය

- **සියදිවි නසා ගැනීම**

  සියදිවි නසාගැනීම පිළිබඳ නිර්වචන හා අර්ථ දැක්වීම්
  සියදිවිනසාගැනීම පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යායන්
  සියදිවිනසාගැනීම සමාජ ගැටළුවක් ලෙස හඳුනා ගැනීම
  සියදිවිනසාගැනීමට හේතුවන කාරණා හඳුනාගැනීම
  සියදිවිනසාගැනීම ආශ්‍රිතව ඉස්මතුවන සමාජ ගැටලු
  සියදිවි නසාගැනීමේක්‍රම හා සියදිවි නසා ගැනීමවැලැක්වීම සඳහාවූ පිළියම්

- **ජනගහන වර්ධනය සහ පාරිසරික ගැටළු (Population Crisis and Environmental Problems)**

  ජනගහන වර්ධනය පිළිබඳ න්‍යායන්
  ජනගහන වර්ධනය මගින් ඇති කරන ලද පාරිසරික ගැටළු
  ජනගහන වර්ධනය ආශ්‍රිත වෙනත් සමාජ ගැටළු

- **බාල අපරාධ (Juvenile Delinquency)**

  බාල අපරාධ යන්න නිර්වචනය සහ අර්ථ දැක්වීම
  බාල අපරාධකරුවන් සමාජයට අවතීර්ණවීමට බලපාන සමාජයීය සාධක හඳුනාගැනීම ඃ බිඳුණු පවුල් සබඳතා සහ නිසි සමාජානුයොජනයක් නොලැබීම, ලේබල්කරණය, පවුලේ ආර්ථික දුෂ්කරතා, සමාජය වෙතින් කොන් කිරීම හා වෙනස්කොට සැලකීම, අපරාධකාරී චර්යාවන්ට අනුබලයක් සපයන පාරිසරික තත්ත්වයන්.
  බාල අපරාධකරුවන් ලෙස සැළකෙන ළමුන් නිරතවන සාවද්‍ය චර්යාවන් හඳුනාගැනීම.
  බාල අපරාධකාරීත්වය තුළින් මතුවන සමාජ ගැටලු හඳුනාගැනීම

- **ස්ත්‍රී දූෂණ (Rape)**

  ස්ත්‍රී දූෂණය යන්න නිර්වචනය සහ අර්ථ දැක්වීම

  ස්ත්‍රී දූෂණය සාධාරණීය කරන සමාජයීය කාරණා හඳුනාගැනීම ඃ පුරුෂාධිපත්‍ය, කාන්තාව පිළිබඳ සෘණාත්මක සමාජයීය ආකල්ප

  ස්ත්‍රී දූෂණය හා සම්බන්ධ ගැටලුකාරී තත්ත්වයන් හඳුනාගැනීම ඃ දූෂණයට ලක් වූකාන්තාවන් මරා දැමීම, දැඩි මානසික හා කායික වධ වේදනාවන්ට ගොදුරු වීම, ලිංගාශ්‍රිත රෝගාබාධයන්ට ගොදුරුවීමට ඇති අවධානම, මානසික රෝගී තත්වයන්ට ගොදුරුවීමට ඇති අවධානම

- **ළමා ගණිකාවෘත්තිය (Child prostitution)**

  ළමා ගණිකාවෘත්තිය යන්න අර්ථ දැක්වීම

  ළමුන් ගණිකාවෘත්තියට යොමුවීම සහ යොමුකරවීම කෙරෙහි බලපාන හේතුන් හඳුනාගැනීම

  ළමා ගණිකා වෘත්තිය හා සම්බන්ධ ගැටලුකාරී තත්ත්වයන් ඃ මූලික මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීම, ළමුන් කායික හා මානසික හිංසනයන්ට ලක්වීම, ලිංගිකාශ්‍රිත රෝගාබාධයන්ට ගොදුරුවීමට ඇති අවධානම, ගැබ් ගැනීමට ඇති අවධානම, කායික රෝගාබාධයන්ට ලක්වීම

- **ළමා අපයෝජනය හා ළමුන් නොසළකා හැරීම**

  ළමා අපයෝජනය හා ළමුන් නොසළකා හැරීම අර්ථ දැක්වීම

  ළමාඅපයෝජනයේ ස්වරූපයන් හඳුනාගැනීම ඃ මානසික අපයෝජනය, කායික අපයෝජනය, ලිංගික අපයෝජනය

  ළමාඅපයෝජනය සහනොසළකාහැරීම නිසා මතුවන ගැටලුකාරී තත්ත්වයන්

- **පවුල් විසංවිධානය වීම (Family disorganization)**

  නූතන පවුල අර්ථ දක්වීම

  පවුල් විසංවිධානයේ ස්වරූපයන් ඃ පවුල් ඒකකයේ බිඳවැටීම, පවුලේවගකීම් ඉටු නොකිරීම

  පවුල් විසංවිධානය වීම ආශ්‍රිත ව මතුවන සමාජ ගැටලු

- **ගණිකා වෘත්තිය**

## 5. නිර්දේශිත කියවීම්


Gunewardena, Dileni (2003) Poverty measurement: meanings, methods and requirements, Center for Poverty Analysis, Colombo.

Hettige, S.T. ed. (1996) Unrest or revolt: some aspects of youth unrest in Sri Lanka Colombo Goethe - Institute.

Kenneth j Mary Alice and Davita Silfen (2007) Social problems: A critical Approach 5th edition, Mc Graw Hill.

Kumara, A (2002) Social Structure and Social problems, Anmol Publications pvt. Ltd. New Delhi.

Kulatunga, K.M.M.B. (2005) Disorder in Sri Lanka, Nidahas Publishers, Nugegoda

Ritzier, George (2004) Handbook of Social problems; A comparative International perspective, Sage Publications, London.

Samarasinge, Diyanath (2005) Strategies to address alcohol problems FORUT.

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

**පාඨමාලා ඒකකය** : පර්යේෂණ වාර්තාව

**පාඨමාලා සංකේතය** : SOC 6243

**අර්ඝ ප්‍රමාණය** : 04

**අධීක්ෂණ පැය** : 60

## 1. ස්වාධීන පර්යේෂණ වාර්තාවට අදාළ උපදේශකත්වය

එක් එක් අපේක්ෂකයා සඳහා ඔහු / ඇය විසින් තෝරාගනු ලබන අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව සමාජවිද්‍යා අධ්‍යයන අංශය මගින් උපදේශකවරයකු / උපදේශකවරියක පත්කරනු ලැබේ.

සෑම අපේක්ෂකයකු ස්වකීය උපදේශකවරයා හමුවී අවශ්‍ය උපදෙස් ලබා ගැනීම අනිවාර්ය වේ. ඒ බව (හමුවීම) තහවුරු කිරීම සඳහා උපදේශකවරයාගේ නිර්දේශය සහිත පැමිණීමේ ලේඛණයක් එක් එක් අපේක්ෂකයා විසින් පවත්වාගෙන යා යුතු වේ.

## 2. ස්වාධීන පර්යේෂණ වාර්තාව පිළියෙල කිරීම

මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය මගින් හඳුන්වා දී ඇති පොදු නිර්ණායකයනට අදාළව වාර්තාව පිළියෙළ කළ යුතු වේ.

v. අකුරු ප්‍රමාණය (Font Size) : 12
vi. පිටුවේ ප්‍රමාණය : A4
vii. පේළි අතර පරතරය : 1.5
viii. සීමා : වම 1.5'', දකුණ 1'', ඉහළ 1'', පහළ 1''

## 3. ස්වාධීන පර්යේෂණ වාර්තාවේ සැකැස්ම

- ආරම්භක පිටුව - (මාතෘකාව, විභාග අංකය, අධ්‍යයනාංශය)
- ශිෂ්‍යයාගේ ප්‍රකාශය
- උපදේශකගේ සහ අධ්‍යයනාංශ ප්‍රධානිගේ නිර්දේශය
- පටුන
- වගු, සිතියම්, ප්‍රස්ථාර, ඡායාරූප නාමාවලිය
- සාරාංශය

- පර්යේෂණ මාතෘකාව පිළිබඳ හැඳින්වීම
- පර්යේෂණ ගැටලුව ප්‍රකාශ කිරීම
- පර්යේෂණයේ අරමුණු
- පර්යේෂණයේ වැදගත්කම
- සාහිත්‍ය විමර්ශනය
- පර්යේෂණ ක්‍රමවේදය
- තොරතුරු ඉදිරිපත් කිරීම
- නිගමන හා යෝජනා
- ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය
- උප ග්‍රන්ථ

**4. ස්වාධීන පර්යේෂණ වාර්තාව ඇගයීම් පටිපාටිය**

දෙවන සමාසිකයට අදාල ලකුණු 100 පහත දැක්වෙන නිර්ණායකයනට අනුව ප්‍රදානය කෙරේ.

| | |
|---|---|
| ක්‍රමවේදය හා අදාලතාව | 20 |
| දත්ත විශ්ලේෂණය හා ඉදිරිපත් කිරීම | 30 |
| වාර්තාවේ නිමාව | 20 |
| තර්කන ගොඩනැගීම හා ශාස්ත්‍රීය ලේඛණ ශෛලිය | 10 |
| අනාවරනය | 10 |
| නිසි පරිදි උපදෙස් ලබා ගැනීම | 10 |
| | 100 |

**සමාජවිද්‍යා අධ්‍යයනාංශය - රුහුණ විශ්වවිද්‍යාලය**

**සමාජවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව**

**පාඨමාලා ඒකකය** : ගෝලීයකරණය සහ සංවර්ධනය

**පාඨමාලා සංකේතය** : SOC 6244

**අර්ස ප්‍රමාණය** : 04

**දේශන පැය** : 60

**ඇගයීම් ක්‍රමය** :

- අඛණ්ඩ ඇගයීම් 20%
  (පන්ති කාමර පරීක්ෂණ, කණ්ඩායම් හා තනි පුද්ගල පැවරුම්, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම්)
- මධ්‍ය සමාසික පරීක්ෂණය 20%
- සමාසික අවසාන පරීක්ෂණය 60%
- එකතුව 100%

**පාඨමාලාවේ අරමුණු:**

i. සමකාලීන සමාජීය සන්දර්භය තුළ ගෝලීයකරණය පිළිබඳ මූලික සංකල්ප හඳුනාගැනීම

ii. ගෝලීයකරණ ක්‍රියාවලිය තුළ ශ්‍රී ලාංකීය සමාජයෙහි සමාජ-ආර්ථික සහ සංස්කෘතිකමය බලපෑම් අධ්‍යයනය කිරීම

**අපේක්ෂිත ප්‍රතිඵල**

පාඨමාලාව අවසානයේ දී විද්‍යාර්ථීන්ට වර්තමාන ජාතික සහ අන්තර්ජාතික ගෝලීයකරණීය ක්‍රියාවලිය පුළුල් සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබීම

**පාඨමාලාවේ අන්තර්ගතය**

**01. ගෝලීයකරණය හැඳින්වීම සහ නිර්වචන**

- ගෝලීයකරණයෙහි ඉතිහාසය
- ගෝලීයකරණය අර්ථ දැක්වීම
- ලෝක පද්ධති න්‍යාය
- විශ්ව ගම්මානය සහ ගෝලීයකරණ සංකල්ප
- නවීන ලෝකය සහ ගෝලීයකරණය

**02. ආර්ථික ගෝලීයකරණය**

- ආර්ථික ගෝලීයකරණයේ නියාමක ආයතන
- ලෝක වෙළෙඳ සංවිධානය
- ජාත්‍යන්තර මූල්‍ය ආයතන
- වාණිජමය මැදිහත්වීම් සහ ජාලගතවීම්
- ජාතික රාජ්‍යයන්ගේ සහ සංවර්ධිත රටවල කාර්යභාරය
- ගෝලීයකරණ යාන්ත්‍රණයන්
    - බහු පාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම්
    - අන්තර්ජාතික ආධාර සහ ඒවායේ කොන්දේසි
    - තාක්ෂණික අනුග්‍රාහකත්ව සහ සංවර්ධන ව්‍යාපෘතීන්

**03. ගෝලීයකරණය සහ සමාජය**

- ගෝලීයකරණය සහ සමාජ න්‍යායන්
- ගෝලීයකරණය සහ ඓතිහාසික සමාජ විද්‍යාව
- සමාජ විපර්යාසය සහ නවීකරණය
- සංක්‍රමණය

**04. දේශපාලනික ගෝලීයකරණය**

- ජාතික රාජ්‍යය සහ ස්වෛරීභාවය පිලිබඳ කතිකාව
- අයිතීන් සහ සමාජ සාරධර්මයන්ගේ විශ්වීයත්වය සහ විවිධත්වය
- යුද්ධය සහ සාමය ගෝලීයකරණයවීම.
- ගෝලීය පාලනයඃ මධ්‍යගතකරණය සහ බණ්ඩනීකරණය
- ගෝලීය ආණ්ඩු ක්‍රමයඃ දේශපාලනික සංස්කෘතිය - ස්වතන්ත්‍රවාදී (නිදහස්වාදී)/සමාජ-ප්‍රජාතන්ත්‍රවාදී

**05. ගෝලීයකරණය සංස්කෘතික ප්‍රවාහයක් ලෙස**

- මූලධර්මවාදය/ආගම්වාදය
- ජාතිකවාදය/විශ්වදේශවාදය
- පාරිභෝගික සංස්කෘතිය
- මාධ්‍ය සහ සංකේතාත්මක අන්තර් ක්‍රියාවන්ඃ විද්‍යුත් මැදිහත්වීම්
- තොරතුරු තාක්ෂණය

**06. ගෝලීයකරණය සහ ශ්‍රී ලාංකීය සමාජය**

- ගෝලීයකරණය සහ පූර්ව යටත්විජිත සමය
    - ජාත්‍යන්තර සබඳතා
    - වෙළෙඳ, සංස්කෘතික සහ ආගමික ගනුදෙනු

- ගෝලීයකරණය සහ යටත්විජිතකරණය
    - යැපුම් ආර්ථිකයෙන් වාණිජමය ආර්ථිකයට විතැන් වීම
    - ශ්‍රී ලාංකීය සමාජය තුළ ව්‍යුහාත්මක වෙනස්වීම් කුල, පංති ස්ථරායනයන් ඇතිවීම.
- පශ්චාත් යටත්විජිත සමය තුළ ගෝලීයකරණය
    - ප්‍රතිසංස්කරණ සහ පෞද්ගලීකරණය
    - ශ්‍රී ලංකා රජය මගින් අත්සන් තැබූ සහ සාකච්ඡා කළ වෙළෙඳ ගිවිසුම්

**07. ගෝලීයකරණයට එල්ලවන විවේචන සහ ප්‍රතිචාර**

- සාධනීය ප්‍රතිචාර
    - දැනුම හුවමාරුව
    - තාක්ෂණය හුවමාරුව
    - නිශේධාත්මක ප්‍රතිචාර
    - සංස්කෘතික විවිධත්වය
    - ආර්ථිකමය බෙදීම්
    - ගෝලීයකරණය සඳහා වන ව්‍යාපාර

**නිර්දේශිත කියවීම්**


Blb, Deacon, Michelle, Hulse, and Paul, Stubbs (1997) Global Social Policy: International Organizations and the future of welfare, SAGE publications, London.

Drucker. Peter (1994) Post Capitalist Society, Clays Ltd. St lives Pic. Great Britain.

Keith. Griffin (1996) Studies in Globalization and Economic Transitions, Macmillan Press Ltd, London.

Khor, Martin (2000) Rethinking Globalization: Critical Issues and Policy Choices. www. amazon.com

Kiely, Ray, (2005) Empire in the Age of Globalization: U.S. Hegemony and Neo-Liberal Disorder Pluto Press London.

Munshi, Surendrs, and Biju, Paul Abraham (2004), Good governance democratic societies and globalization. Sage publications India pvt Ltd, New Delhi.

Stubbs, R. and Underhill, G. (eds.) (2002). Political Economy and the Changing Global Order, 2nd end. Oxford: OUP.

Wallace, Lain (1992) The Global Economic System. Routledge London.

Waters, Malcolm (1995) Globalization, Routledge London.

Watson, Tony. J. (1995) Sociology, Work and Industry, Routledge London.

Weiss, L. (1999) Globalization and National Governance: Antinomies or Interdependence? Review of International Studies 25 (Special Issue): 59-88,

World Bank (2002) Globalization, Growth and poverty: building and inclusive world economy, Policy Research Report, Washington DC: World Bank.

කරුණාදාස ඩබ්.එම්. (1999) ගෝලීයකරණය හා කලාපීයකරණය, ඉමේජ් ලංකා පබ්ලිෂර්ස්, දෙහිවල.